# City NEWS

MINISTRY OF URBAN DEVELOPMENT AND HOUSING

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ නිළ ඊ පුවත් පත

කලාප 07

2023 මැයි 01


# කොළඹ අගනගරය ආශ්‍රිත

## ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියට කැබිනට් අනුමැතිය.

(අමිල දර්ශන හේරත් )

කොළඹ අගනගරය ආශ්‍රිත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරීත්වය යටතේ ඉදිරියටත් තිරසර ලෙස පවත්වාගෙන යාම සඳහා නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා ඉදිරිපත්කළ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවට කැබිනට් අනුමැතිය හිමිවේ.

මෙම ව්‍යාපෘතිය ඉදිරියටත් ක්‍රියාත්මක කිරීමට සුදුසු ක්‍රමවේදයක් සකස්කරන ලෙසට අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා විසින් පසුගියදා නාගරික සහ නිවාස අමාත්‍යාංශයේ ලේකම්වරයාට උපදෙස් දී තිබිණි. ඒ අනුව සුදුසු ක්‍රමවේදයක් සැකසීම සඳහා අමාත්‍යාංශ ලේකම්වරයා විසින් විශේෂඥ තාක්ෂණික කමිටුවක් පත්කරනු ලැබීය.

පිටුව 02




ලොදියත් දරාගන ගිනාවෙන ගිනිකදු
මහ වැස්ස ගිනි අව්ව වෙනස් නෑ කුණුකදු
මහ පාරේ ගෙවෙනකොට ජීවිතේ දුක්කදු
කිඩාරම් මල් නොවේ අපිත් මල් වතුසුදු

රූව - අන්තර්ජාලයෙන්

පද - තරූ අත්තනායක

# බිම් බෝම්බ ඉවත් කිරීමට ඇත්තේ තවත් වර්ග කිලෝමීටර 15ක පමණයි.

(නිහාර චාමික පෙරේරා)

මේ වනවිට  තවත් වර්ග කිලෝමීටර 15 කට ආසන්න භූමි ප්‍රමාණයක පමණක් බව නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතාගේ උපදෙස් පරිදි නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය, බිම්වෙඩි පිළිබඳ ක්‍රියාකාරී ජාතික මධ්‍යස්ථානය සහ ශ්‍රී ලංකා යුධ හමුදාව එක්ව බිම් බෝම්බ ගලවා ඉවත් කිරීම සිදුවේ.

ඒ අනුව 2027 වසර අවසන්වන විට මෙරට බිම් බෝම්බ වලින්තොර රටක් බවට පත්කිරීමට හැකිවනු ඇතැයි බිම් බිම්වෙඩි පිළිබඳ ක්‍රියාකාරී ජාතික මධ්‍යස්ථානය පවසයි. මෙරට බිම් බෝම්බ ඉවත් කිරීමේ කටයුතු සඳහා ශ්‍රී ලංකා යුධ හමුදාව සෘජු දායකත්වයක් ලබා දෙන අතර ශ්‍රී ලංකා යුධ හමුදා මානුෂ්‍යවාදී බිම් වෙඩි ඉවත් කිරීමේ ඒකකය හරහා එය සිදු කෙරේ. ඊට අමතරව අන්තර් ජාතික රාජ්‍ය නොවන සංවිධාන දෙකක් හා දේශීය රාජ්‍ය නොවන සංවිධාන දෙකක් විසින් මෙරට බිම් බෝම්බ ඉවත් කිරීමේ කටයුතු සිදු කරනු ලබයි.

පිටුව 02

# ඔබට ගෙයක් - රටට හෙටක් නිවාස ආධාර ව්‍යාපෘතියේ ඉදිකිරීම් සියයට 50ක් අවසන්.

(නිහාර චාමික පෙරේරා)

"ඔබට ගෙයක් - රටට හෙටක්" නිවාස ආධාර ව්‍යාපෘතියේ නිවාස ඉදිකිරීම් මේ වනවිට සියයට 50ක පමණ වැඩ අවසන්ව ඇතැයි ජාතික නිවාස සංවර්ධන අධිකාරිය පවසයි.

ඒ අනුව 2021 වසරේදී නිවාස 12231ක ඉදිකිරීම් ආරම්භ කර ඇති අතර ඉන් නිවාස 6039ක වැඩ අවසන් කර තිබේ. එමෙන්ම 2022 වසරේදී නිවාස 1465ක වැඩ ආරම්භ කළද වැඩ අවසන්ව ඇත්තේ නිවාස 25ක පමණි.

මෙම ව්‍යාපෘතිය යටතේ ගම්පහ දිස්ත්‍රික්කයතුළ පමණක් නිවාස 1215ක වැඩ ආරම්භ කර ඇති අතර ඉන් නිවාස 727ක වැඩ අවසන්ව ඇත. එමෙන්ම මීනුවන්ගොඩ ආසනයතුළ පමණක් නිවාස 159ක වැඩ ආරම්භ කර තිබේ. මේ වනවිට ඉන් නිවාස 78ක වැඩ අවසන්කර ඇතිබවද ජාතික නිවාස සංවර්ධන අධිකාරිය පවසයි.

පිටුව 02

## සැහැල්ලු දුම්රියෙන් කොළඹ වටේ රවුමක්..



පිටුව 05

## මැයි දින වගතුග

පිටුව 03

# ඉදිකිරීම් ක්ෂේත්‍රයේ නිරතව සිටින ලක්ෂ 13 ක් වූ ඉදිකිරීම් ශිල්පීන් රැක ගැනීම අපේ වගකීමයි.

(නාලක සංජීව දහනායක)

ඉදිකිරීම් ක්ෂේත්‍රයේ නිරතව සිටින ලක්ෂ 13 ක් වූ ඉදිකිරීම් ශිල්පීන් රැක ගැනීම සිය අමාත්‍යාංශයේ වගකීම බව නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ ලේකම් ඩබ්ලිව්. එස්. සත්‍යානන්ද මහතා පවසයි.

කොවිඩ් සහ ආර්ථික අර්බුදය හමුවේ කඩාවැටුණු මෙරට ඉදිකිරීම් කර්මාන්තය නැවත ඉහළට ගැනීම සඳහා සිය අමාත්‍යාංශය මේ වනවිටත් සැලසුම් සකස්කර අවසන් බවද ඔහු සඳහන් කලේය. මෙරට ඉදිකිරීම් කර්මාන්තය නගා සිටුවීම සඳහා මූල්‍යමය සහ මූල්‍යමය නොවන විසඳුම් ලබා දිය යුතු බවද ඔහු පැවසීය.

පිටුව 02

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ City News නිළ ඊ පුවත්පත සඳහා පිවිසෙන්න

City NEWS
MINISTRY OF URBAN DEVELOPMENT AND HOUSING




# කතු වැකිය

*රුපියල් මත පදනම්ව බලහත්කාරයෙන් නිර්මාණය කරන ලද පරිසරයක් තුළ ඇත්තටම කය වෙහෙසා වැඩ කරන කම්කරුවෝ බොහෝය. කය පමණක් නොව මානසික ශ්‍රමයද වෙහෙසන්නෝ බොහෝය. ඔවුහු බොහෝ දෙනෙක් අද දවසේද වැඩ කරති. මන්ද, ඔවුන් වැඩි දෙනෙකුට වැටුප් ලැබෙන්නේ වැඩ කළොත් පමණක් වන හෙයිනි. ඉතිං එවන් ශ්‍රම විරුවන්ට අපගේ උත්තමාචාරය...*□



**උපදේශකත්වය**
ඇමතිතුමාගේ මාධ්‍ය ලේකම්
ප්‍රදීප් අනුර කුමාර
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය
**සංස්කරණය**
නාලක දහනායක
අමිල දර්ශන හේරත්
**පිටු සැකසුම**
ධනුෂිකා කුමාරි
**විශේෂාංග ලිපි**
නාලක දහනායක
නිහාර චාමික පෙරේරා
අමිල දර්ශන හේරත්
මුනීරා අබු බක්කර්
**සෝදුපත් බැලීම**
පී.බී.එස්. සම්පත්
**සම්බන්ධීකරණය**
දිලිනි කෞෂල්‍යා
නදුන් තාරක
නිලංක නිරෝෂන්
**ඡායාරූප**
නුවන් දිනේන්ද්‍ර
නලින් හේවාපතිරණ
සරත් ජයතිලක
**පරිගණක සහය**
සචිදු සංකල්ප
තිළිණ නිර්මාල්

මාධ්‍ය ඒකකය
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය
2 වන මහළ
සෙත්සිරිපාය
බත්තරමුල්ල
94 11 286 7163
94 11 286 5479
paper.citynews@gmail.com

## ඔබට ගෙයක් - රටට හෙටක්...

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය පවසන්නේ කොරෝනා වයිරස ව්‍යප්තිය හා රට මුහුණදුන් ආර්ථික අර්බුදය හමුවේ "ඔබට ගෙයක් - රටට හෙටක්" නිවාස ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු තාවකාලිකව නතර කෙරුණු බවයි. එහෙත් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතාගේ උපදෙස් පරිදි මෙම වසර මුලදී නිවාස ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු යළි ආරම්භ කරනු ලැබිණ.

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා රජයෙන් කළ ඉල්ලීමකට අනුව මීට පෙර වසරවලදී ආරම්භ කර නිම නොවූ ව්‍යාපෘතිවල වැඩ අවසන් කිරීමට මහා භාණ්ඩාගාරය විසින් රුපියල් මිලියන 3,750ක මුදලක් ජාතික නිවාස සංවර්ධන අධිකාරියට ලබාදී තිබේ.

ඒ අනුව අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා ජාතික නිවාස සංවර්ධන අධිකාරියට උපදෙස් දී තිබෙන්නේ එම මුදල් යොදාගනමින් "ඔබට ගෙයක් - රටට හෙටක්" නිවාස ව්‍යාපෘතිය යටතේ වැඩ ආරම්භකර, අවසන්කිරීමට නොහැකිවූ සියලුම නිවාසවල ඉදිකිරීම් කටයුතු අවසන් කරන ලෙසයි.

## කොළඹ අගනගරය ආශ්‍රිත...

එම විශේෂඥ තාක්ෂණික කමිටුව විසින් කොළඹ අගනගරය ආශ්‍රිත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් දීර්ඝ තාක්ෂණික විශ්ලේෂණයක් කිරීමෙන් අනතුරුව වාර්තාවක් ඉදිරිපත්කර තිබේ.

එම වාර්තාවට අනුව මෙම ව්‍යාපෘතියේ ආරම්භක සැලැස්ම අනුව පවත්වාගෙන යාම සඳහා රුපියල් බිලියන 2.125ක පමණ වාර්ෂික පිරිවැයක් දැරීමට සිදුවේ.

එමෙන්ම මෙම ව්‍යාපෘතියෙන් දිනකට කසල මෙට්‍රික් ටොන් 300 ක් ආර්ථිකමය වාසි ලබාගත හැකි බවද අදාළ කමිටු වාර්තාව මගින් පෙන්වා දී තිබේ.

සාමාන්‍යයෙන් කොළඹ නගරයේ පමණක් දිනකට කැලිකසල මෙට්‍රික් ටොන් 600ට අධික ප්‍රමාණයක් එකතුවේ. එම කසළ කැලණිය ප්‍රදේශයට එකතුකර එතැන්සිට දුම්රිය මගින් අරුවක්කාලු ප්‍රදේශයට රැගෙනගොස් සනීපාරක්ෂක ක්‍රමයට රඳවනු ලැබේ.

අරුවක්කාලු ප්‍රදේශයේ අක්කර 265ක භූමි ප්‍රදේශයක මෙම සනීපාරක්ෂක කසළ රඳවන ව්‍යාපෘතිය ක්‍රියාත්මක අතර, එමගින් අක්කර කිහිපයක්ම උද්‍යානයක් ලෙස අලංකාර කිරීම, ආරක්ෂක භූමි සහ පරිසර හිතකාමී තත්ත්වය ඇති කිරීමට වෙන් කර තිබීම ද විශේෂත්වයකි.

අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා පවසන්නේ පුද්ගලික සමාගමක් සමග එක්ව රජයේ මුදල් භාවිත නොකර මූල්‍යමය ලෙස ලාභදායි සහ රටට හිතකර සහ තිරසර ලෙස පවත්වාගෙන යාමට කටයුතු කරන බවයි. ව්‍යාපාර ආකෘතියක් යටතේ මෙම ව්‍යාපෘතිය කරගෙන යෑමෙන් රජයට යම්කිසි ලාභාංශයක් ලබාගත හැකි බවද අමාත්‍යවරයා පෙන්වාදෙයි.

## බිම් බෝම්බ ගලවා ඉවත් කිරීමට ඇත්තේ...

මෙරට බිම් බෝම්බ ඉවත් කිරීමේ කටයුතු සඳහා රජය විසින් ශ්‍රී ලංකා යුධ හමුදාවේ මානුෂ්‍යවාදී බිම් වෙඩි ඉවත් කිරීමේ ඒකකයට මූල්‍යාධාර ලබා දෙයි. මෙම වැඩසටහන සඳහා ආධාර සපයනු ලබන ජාත්‍යන්තර ආයතනවලින් අනෙක් රාජ්‍ය නොවන සංවිධාන 4 සඳහා වාර්ෂිකව ඇමරිකානු ඩොලර් මිලියන 17.5 ක මුදලක් සපයනු ලබයි.

මේ වන විට උතුරු හා නැගෙනහිර පළාත්වල වර්ග කිලෝමීටර 204 කට අධික භූමි ප්‍රමාණයක පුද්ගල නාශක බිම් බෝම්බ ඉවත් කොට සිවිල් ජනතාව වෙනුවෙන් නිදහස් කර තිබේ. තවත් වර්ග කිලෝමීටර 15 කට ආසන්න භූමි ප්‍රමාණයක බිම් බෝම්බ ගලවා ඉවත් කිරීමට නියමිතව ඇති බව බිම්වෙඩි පිළිබඳ ක්‍රියාකාරී ජාතික මධ්‍යස්ථානය සඳහන් කරයි.

## ඉදිකිරීම් ක්ෂේත්‍රයේ...

ඒ අනුව දේශීය කුඩා හා මධ්‍ය පරිමාණ කොන්ත්‍රාත්කරුවන් මුහුණ පා ඇති ගැටළුවලට විසඳුම් ලබාදී ඔවුන් ශක්තිමත් කිරීම අරමුණින් උපදේශන වැඩසටහන් මේ වනවිට ආරම්භ කර තිබේ.

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතාගේ උපදෙස් මත මෙම වැඩසටහන ක්‍රියාවට නැංවේ. නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය යටතේ ඇති ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය (CIDA ), ජාතික ඉදිකිරීම් සංගමය සහ ඉන්සි සිමෙන්ති සමාගම එක්ව මෙම උපදේශන සේවාව සංවිධානය කරනු ලබයි.




# මැයි දින වගතුග

ලෝක කම්කරු දිනය මැයි 1 වැනිදාට යෙදී තිබේ. වැඩ කරන ජනතාවගේ දිනය වශයෙන් ද මැයි දිනය ප්‍රකටය. ලෝකවාසී වැඩ කරන ජනයා විසින් මෙවර සමරනු ලබන්නේ 134 වැනි මැයි දිනයයි. කොවිඩ් 19 ගෝලීය වසංගතය හේතුවෙන් පසුගිය දෙවසරේදීම එය උත්සවාකාරයෙන් සැමරීමට බාධා ඇති විය. ශ්‍රී ලංකාව ද ඇතුළුව ලෝකයේ රාජ්‍යයන් 80කට වැඩි ගණනක් මැයි 1 වැනිදා නිවාඩු දිනයක් ලෙස සලකා එය සැමරීමට එක් වේ.

වර්ෂ 1886 මැයි 1 වැනිදා අමෙරිකා එක්සත් ජනපදයේ විවිධ ව්‍යාපාර අංශවල නියැළෙන ශ්‍රමිකයෝ 300,000 කට වැඩි පිරිසක් චිකාගෝ නුවර හේමාකට් චතුරස්‍රයට රැස්වී දවසේ වැඩ කරන පැය ගණන පැය 8කට සීමා විය යුතු බවට තරයේ කියා සිටියහ. ඔවුන්ගෙන් 40,000ක පමණ පිරිසක් වැඩ වර්ජනයකට ද අවතීර්ණ වූහ. එය දීපව්‍යාප්ත වර්ජනයක් දක්වා දිගු විය. මැයි 03 වැනිදා වන විට එය ප්‍රචණ්ඩ අතට හැරෙන්නට වූ අතර මැකෝර්මික් කම්හලේදී එය දිස් විය.

> **"වර්තමානයේදී කම්කරු පංතියට අරගල කිරීමට සිදුව ඇත්තේ අලුත් අභියෝග සමඟය."**

එනම් මැයි 4 වැනිදා හේමාකට් චතුරස්‍රයේදී කම්කරුවන්ගේ සාමකාමී රැස්වීමක් පැවැත්වෙමින් තිබිණි. එහිදී දවසේ වැඩ කරන පැය ගණන පැය 8කට සීමා විය යුතු බවට හඬ නැගුණි. එහි පැමිණි පොලිස් නිලධාරීහු 180 දෙනෙක් පමණ රැස්වීම නතර කිරීමට අණ කෙරුණි. එහි සිටි අය ප්‍රතිචාර දැක්වූයේ මෙය සාමකාමී රැස්වීමක් යැයි පවසමිනි. එහිදී පොලිස් නිලධාරීන් සිටි දෙසින් බෝම්බයක් පුපුරා ගියේය. එම පිපිරීමෙන් පොලිසියේ 67 දෙනෙක් තුවාල ලබා 7 දෙනෙක් ජීවිතක්ෂයට පත්වූ බව වාර්තා විය. ඒ සමඟම පොලිසිය වෙඩි තැබීමක් සිදු කළහ. මේ වෙඩි තැබීම්වලින් 200ක් පමණ තුවාල ලැබූ අතර, සය දෙනෙක් ජීවිතක්ෂයට පත් වූ බව වාර්තා විය. හේමාකට් චතුරස්‍රයේ සිදුවීම අමෙරිකා ඉතිහාසයට එක්ව ඇත්තේ ඛේදවාචකයක් ලෙසිනි.

වර්ෂ 1889දී පැවැති අන්තර්ජාතික සමාජවාදී සමුළුවේදී මේ සිද්ධිය ස්මරණය කරමින් මැයි 1 වැනිදා කම්කරුවන් වෙනුවෙන් අන්තර්ජාතික නිවාඩු දිනයක් ලෙස ප්‍රකාශයට පත් කළ යුතු බවට තීරණය විය. කෙසේ වුව ද සීතල යුද්ධයේ මුල් අවධියේදීම 1958 ජූලි මස අමෙරිකා ජනාධිපති ඩ්වයිට් ඩී. අයිසන්හවර් අත්සන් කළ විධානයකින් මැයි 1 වැනිදා පක්ෂපාතිත්වයේ දිනය වශයෙන් ප්‍රකාශයට පත් කෙරිණි. ලෝකවාසී කම්කරු ජනයා සමඟ කවර ආකාරයක හෝ සහයෝගිතාවක් පවත්වා ගැනීම වැළැක්වීම එහි අරමුණ වූයේ උග්‍ර කොමියුනිස්ට් විරෝධය ද සමඟය. පක්ෂපාතීත්වය යනුවෙන් මෙහිදී අදහස් කෙරුණේ අමෙරිකාවට පක්ෂපාති වීමය. අමෙරිකාවේ නිදහස හා උරුමය පිළිගැනීමය.

> **"වෘත්තීය සමිති නායකයන්යැයි කියා ගන්නා උදවිය පවා වැඩි දෙනෙක් සිය සේවා ස්ථානවල සේවය නොකරයි."**

පැය 8ක වැඩ දිනය වෙනුවෙන් අරගල කිරීමට සිදු වූයේ ඒ වන විට පැය 14, 16 පමණක් නොව පැය 18 සේවා මුර පවා කම්කරුවන් වෙත පැවරී තිබූ බැවිනි. එය පැය 20ක් පමණ වූ අවස්ථා ද වාර්තා වී තිබේ. පැය 8ක වැඩ දිනය වෙනුවෙන් අරගල කිරීමට පෙර දශක කිහිපයකට පෙර පැය 10 සේවා මුර වෙනුවෙන් ද විරෝධතා ක්‍රියාත්මක වී තිබේ.

වෘත්තීය සමිති ව්‍යාපාරයේ ආරම්භය සටහන් වන්නේ ද එම වකවානුවලදීය. ජාතික කම්කරු සංගමය බිහි වූයේ සහ විලියම් එච්. සිල්විස් වැනි කම්කරු නායකයන්ගේ මතු වීම සිදු වූයේ 1860 ගණන්වලදීය. කෙසේ වුව ද ලෝක කම්කරු දිනයට සෘජුව හා සමීපව සම්බන්ධ සිදුවීම 1886 හේමාකට් චතුරස්‍රයේදී ඇතිවූ තත්ත්වයයි.

වැඩ කරන ජනයා ඉදිරිපිට එදා පැවැති අභියෝග එලෙසම නැතත් අලුත් අභියෝගවලට විසඳුම් සෙවීමට සිදුව ඇත. මෑතකාලීනව කොවිඩ් 19 ගෝලීය වසංගතයත් සමඟ ලොව බලවත් රටවල පවා රැකියා සුරක්ෂිතතාව විශාල වශයෙන් අභියෝගයට ලක් විය. අමෙරිකාවේ පමණක් රැකියා වියුක්තිය ඉහළ ගියේ ලක්ෂ ගණනිනි. වසංගත සමයේ රැකියා අහිමි වූ ප්‍රමාණය මිලියන සංඛ්‍යාතය. බොහෝ ශ්‍රමිකයන්ට සම්පූර්ණ වැටුප් ලබා ගැනීමට නොහැකි වූ අතර, අඩ වැටුප් ගෙවන ලදී. සේවක වරප්‍රසාද මෙන්ම සුබ සාධනයට ද බලපෑම් ඇති විය. මේවා මතු වූයේ ප්‍රායෝගික තත්ත්ව වශයෙන් වුව ද වර්තමානයේදී කම්කරු පංතියට අරගල කිරීමට සිදුව ඇත්තේ අලුත් අභියෝග සමඟය.

> **"වැඩ නොකර ඉහළ තනතුරු හා වැඩි වැටුප් ලැබීමට බොහෝ දෙනෙකු කැමතිය."**

අරගල යනු වැඩවර්ජන යන්නම අදහස් නොකෙරෙන බව දියුණු කම්කරු ව්‍යාපාර පිළිබඳ හෝ සංස්කෘතියක් පිළිබඳ ගොඩනැඟී ඇති අදහස් හා මතවාද ඔස්සේ පැහැදිලි කරගත හැකි වනු ඇත. වැඩවර්ජන යනු විරෝධතාවයේ එක් උපකරණයකි. වර්ජන කළ යුතු නොකළ යුතු අවස්ථාව මෙන්ම තත්ත්ව පිළිබඳ පවා පුළුල් දැක්මක් තිබිය යුතුය.

අප රටේ බොහෝ කම්කරුවන් තමන් කම්කරුවන් යැයි කියන්නට අකමැතිය. වැඩ නොකර සිටීමට බොහෝ දෙනෙකු කැමතිය වැඩ නොකර තනතුරු හා වැඩි වැටුප් ලැබීමට බොහෝ දෙනෙකු කැමතිය. අද වෘත්තීය සමිති නායකයන්යැයි කියා ගන්නා උදවිය පවා වැඩි දෙනෙක් සිය සේවා ස්ථානවල සේවය නොකරයි.ඇතැම් කම්කරු නායකයන් හමුවී සාකච්ඡා කිරීමට පවා අසීරුය.

මැයි 1 වැනිදා ලෝක කම්කරු දිනය වශයෙන් මෙන්ම ඇතැම් රාජ්‍යයන් වසන්තයේ ඇරඹුම වශයෙන් ද, මල් දිනය (Flowers Day) වශයෙන් ද සමරනු දැකිය හැකිය.ශ්‍රී ලංකාවේ මැයි 1 වැනිදා නිවාඩු දිනයක් බවට පත් වූයේ 1956 පෙරළියෙන් අනතුරුවයි. ඇතැම් වකවානුවල මැයි දිනය සැමරීම මෙරට ද තහනම් විය. තහනම නොතකා මැයි දිනය සැමරූ ජනයාට වෙඩි තැබීමට කටයුතු කර ඇත. මෙරට පළමු මැයි දින සැමරුම සිදුවුනේ 1927 වසරේදීය. එනම් මෙවර එය සැමරෙන්නේ 96 වැනි වතාවටයි. නිවාඩු දිනය ලැබුණේ එම පළමු සැමරුමෙන් දශක 3කට පසුවය.

අමිල දර්ශන හේරත්

# මිහිලියට සෙනෙහස පුදා

# දිවිරැකෙන්න - දියදෝතක්

ගම්පහ දිස්ත්‍රික්කය යනු මෙරට වැඩිම ජනගහණයක් ජීවත් වන දිස්ත්‍රික්කයකි. මෙම දිස්ත්‍රික්කය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 13 කින් සමන්විතය. සමස්තයක් ලෙස ගත් කළ මෙහි ජනතාව මුහුණ දෙන ගැටළු කිහිපයක් පවතී. පානීය ජල ප්‍රශ්නය ඒ අතරින් ප්‍රමුඛ තැනක් ගනී. ගම්පහ දිස්ත්‍රික්කයේ අත්තනගල්ල, නිට්ටඹුව, මීරිගම, මිනුවන්ගොඩ, දොම්පේ සහ ඒ අවට ප්‍රදේශවල ජනතාව අතීතයේ සිටම පානීය ජල ප්‍රශ්නයෙන් පීඩාවට පත්ව සිටී. අපට ආහාර වේලක් නැතුව දවසක් හෝ සිටිය හැකිය. නමුත් ජලය පානය නොකර එක මොහොතක් හෝ අපට සිටිය නොහැකිය. ජලය එතරම්ම මිනිසාට නැතුවම බැරි දෙයකි.

## ● ගම්පහ දිස්ත්‍රික්කයේ ලක්ෂ හතරක ජනතාවට පානීය ජලය

ගම්පහ පානීය ජල අවශ්‍යතාවය වෙනුවෙන් ආරම්භ කෙරුණු වටිනා ජල ව්‍යාපෘතියකි, බස්නාගොඩ ජලාශ ව්‍යාපෘතිය. එය ආරම්භ කර වසර කිහිපයක් ගත වුවද විවිධ හේතු මත එහි කටයුතු කඩින් කඩ නතර කෙරිණ. ඉන් පාඩුව සිදු වූයේ ගම්පහ දිස්ත්‍රික්කයේ ජනතාවටය. කෙසේ හෝ බස්නාගොඩ ජලාශ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් සතුටුදායක පුවතක් අපට පසුගිය කාලයේදී අසන්නට ලැබුනි. එනම් බස්නාගොඩ ජල සම්පාදන ව්‍යාපෘතියේ පළමු අදියරේ නව ජල සබඳතා ලබා දීමට පියවර ගැනීමයි. ගම්පහ, කරස්නාගල, බස්නාගොඩ ජල සම්පාදන ව්‍යාපෘතියේ පළමු අදියරේ නව ජල සබඳතා ලබා දීම පසුගියදා සිදු කෙරුණේ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතාගේ ප්‍රධා-නත්වයෙනි. මෙහිදී පළමුව නව ජල සබඳතා ලබා දුන්නේ පස්යාල ඇල්ලලමුල්ල, මුහන්දිරම්වත්ත සහ කලල්පිටිය ධාතුකන්ද ප්‍රදේශවල ප්‍රතිලාභී පවුල් සඳහායි. ඒ සඳහා ජල සම්පාදන රාජ්‍ය අමාත්‍ය සනත් නිශාන්ත, ගම්පහ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන සහන් ප්‍රදීප්, කෝකිලා ගුණවර්ධන, උපුල් මහේ-න්ද්‍ර රාජපක්ෂ යන මහජන නියෝජිතයින්ද එක්ව සිටියහ.

මෙම ජලසම්පාදන ව්‍යාපෘතිය මගින් ගම්පහ දිස්ත්‍රික්කයේ ග්‍රාමසේවා වසම් 440 ක ලක්ෂ හතරක පමණ ජනතාවගේ පානීය ජල අවශ්‍යතාවය සපුරාලීමට හැකියාව ලැබේ. මෙම ජල ව්‍යාපෘතිය සඳහා වැය කෙරෙන මුලු මුදල රුපියල් මිලියන 33,060 කි. මෙහි පළමු අදියර යටතේ අත්තනගල්ල සහ පස්යාල අවට ජනතාව සඳහා ලබා දෙන නව ජල සබඳතා ගණන 5,000 කි.

මෙහි දෙවන අදියර යටතේ නිට්ටඹුව, මිනුවන්ගොඩ සහ ගම්පහ අවට ප්‍රදේශ රැසක් ආවරණය වේ. මෙම ජල ව්‍යාපෘතියේ දෙවන අදියරේ ඉදිකිරීම් කටයුතු ලබන ඔක්තෝබර් මස වන විට අවසන් කිරීමට නියමිතය. නව ජල සබඳතා ලබා දීමේදී ජනතාවට පහසු වන ආකාරයට වාරික 12 කින් මුදල් ගෙවා නිම කිරීමට හැකිවන පරිදි වැඩපිළිවෙලක් සකසන ලෙස ද ප්‍රසන්න රණතුංග ඇමතිවරයා නිළධාරීන්ට උපදෙස් දී ඇති බව වාර්තා වේ.

## ● ජල ව්‍යාපෘතියේ මුළු වටිනාකම මුදල රුපියල් මිලියන 33,060 යි

මෙම ජල සම්පාදන ව්‍යාපෘතිය ආරම්භ කරනු ලැබුවේ මහින්ද රාජපක්ෂ මහතා ජනාධිපතිවරයාව සිටි සමයේදීය. ඒ එවකට ආර්ථික සංවර්ධන අමාත්‍ය බැසිල් රාජපක්ෂ මහතාගේ සහ එවකට බස්නාහිර පළාත් ප්‍රධාන ඇමතිවරයා වූ ප්‍රසන්න රණතුංග මහතාගේ මූලිකත්වයෙනි. නමුත් යහපාලන රජය බලයට පත්වීමෙන් පසුව එහි කටයුතු අතරමග නතර කෙරිණ. යළි මෙම ජල සම්පාදන ව්‍යාපෘතිය ආරම්භ කරනු ලැබුවේ වත්මන් රජය බලයට පත්වීමෙන් පසුව 2021 වසරේදීයි.



ගම්පහ, අත්තනගල්ල - මිනුවන්ගොඩ ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාවට නැංවෙන මෙම ජල ව්‍යාපෘතිය යටතේ අත්තනගල්ල, මීරිගම, මිනුවන්ගොඩ, මහර සහ දොම්පේ ඇතුළු ප්‍රදේශ රැසක් ආවරණය වේ. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන්නේ වාරිමාර්ග අමාත්‍යංශයේ මෙහෙයවී-මෙන් වාරිමාර්ග දෙපාර්තමේන්තුව සහ ජාතික ජලසම්පාදන මණ්ඩලය එක්වයි. රටකට නව සංවර්ධන ව්‍යාපෘති සැබවින්ම අවශ්‍යය. රට ඉදිරියට යන්නේ එවිටය. නමුත් ඒ හා සමානවම මෙවැනි ව්‍යාපෘතිද රට තුළ ක්‍රියාත්මක කිරීම ඉතාම කාලෝචිතය. බලයට පත්වන සෑම රජයක්ම මෙවැනි ව්‍යාපෘති නතර නොකර අඛණ්ඩව ක්‍රියාත්මක කල යුතුය. රටේ ජනතාවට සෙත සැලසෙන්නේ එවිටය.




නිහාර චාමික පෙරේරා

City NEWS
MINISTRY OF URBAN DEVELOPMENT AND HOUSING

# සැහැල්ලු දුම්රියෙන් කොළඹ වටේ රවුමක්..

අපට මගී ප්‍රවාහන අවශ්‍යතා පිළිබඳ විවිධාකාර ගැටලු තිබේ. නගරයට මෙන් ගමටද අනන්‍ය ප්‍රවාහන ගැටලු ඇත. සමස්තයක් ලෙස ප්‍රමාණවත් මගී ප්‍රවාහන සේවා නොවීම, රථවාහන තදබදය, රිය අනතුරු, රථවාහන නවතා තැබීමේ පහසුකම් නොවීම, නියමිත වේලාවට රථවාහන නොමැතිවීම ආදිය මෙරට ප්‍රවාහනයේදී මගීජනතාව වන අප මුහුණදෙන ගැටලු කිහිපයක් පමණි.

මෙයට විසඳුමක් වශයෙන් බස්නාහිර පළාතේ මගී ප්‍රවාහනය සම්බන්ධව 2012 වසරේ ජපානයේ ජයිකා ආයතනයෙන් අධ්‍යයනයක් සිදුකරනු ලැබීය. සමස්ත පළාත ආවරණය වන පරිදි ගෘහ 35000ක පමණ ප්‍රමාණයක් තෝරාගනිමින් ඒ සමීක්ෂණය සිදුවූ අතර එහි වාර්තාව 2013-2014 වසරවලදී ඉදිරිපත් කරනු ලැබින.




විශේෂයෙන්ම බත්තරමුල්ලේ හා අවට ප්‍රදේශය අධික වාහන තදබදයක් පවතී. පාර්ලිමේන්තුව මෙන්ම බොහෝ අමාත්‍යාංශ බත්තරමුල්ල ප්‍රදේශයට ගෙන යෑමේදී නිසියාකාර සංගණනයක් සිදු නොකිරීම , වාහන අධික වීම මේ මාර්ගයේ අධික වාහන තදබදයක් ඇති වීමට හේතුවකි. මේ වන විට පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව හා ආගමන හා විගමන දෙපාර්තමේන්තුවද බත්තරමුල්ලේ සුහුරුපායට පැමිණීමෙන් මේ තදබදය නිමා නොවන තත්ත්වයක් බවට පත් වූයේ රාජගිරියේ ගුවන් පාලමක් ඉදි කිරීම පවා පලක් නොවන බව පෙන්වා දෙමිනි.

කෙසේ වෙතත් කොළඹ නගරයේ වාහන තදබදය හේතුවෙන් දෛනිකව වැඩකළ හැකි පැය විශාල ප්‍රමාණයක් රටට අහිමිවේ. එපමණක් නොව රටට විශාල මුදලක්ද අහිමිවේ.

මේ අධ්‍යයනය සිදුකරන විට ලංකාවට මොනෝ රේල් තාක්ෂණය හඳුන්වා දීමට ජයිකා ආයතනයට විශේෂ උවමනාවක් තිබුණි.

වර්තමානය සැහැල්ලු දුම්රිය ව්‍යාපෘතිය නමින් කියවෙන මෙහි ආරම්භයට මොනෝ රේල් සම්බන්ධ වේ.

මෙම අධ්‍යයනය අවසානයේ ඉදිරිපත් වූ යෝජනා අතරේ මාලබේ මාර්ගයේ මොනෝරේල් ව්‍යාපෘතියක් සිදුකිරීම පිළිබඳ යෝජනාවක්ද අන්තර්ගත විය. එසේම මෙරට තවත් මාර්ගවල මෙම ව්‍යාපෘතිය සිදුකිරීම පිළිබඳ යෝජනාද මෙහි වූයේය.

ඉඩම් පවරා ගැනීමෙන් පසුව මෙම ව්‍යාපෘතිය 2020 දී ආරම්භ කර 2024 මැද භාගය වනවිට වැඩ අවසන් කිරීමට නියමිතව තිබුණි. නමුත් ඉකුත් සමයේදී රට මුහුණ දුන් ආර්ථික හා සමාජීය අර්බුද හමුවේ මෙම සැහැල්ලු දුම්රිය ව්‍යාපෘතිය නතර කෙරිණි.

මෙවන් පසුබිමක එලෙස ඉදිකිරීම් අවලංගු කළ සැහැල්ලු දුම්රිය ව්‍යාපෘතිය නැවත ආරම්භ කිරීමට ජපාන රජය එකඟ වී ඇත්තේ ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතාගේ පසුගිය ජපාන නිල සංචාරයේ දී පැවති ද්විපාර්ශ්වික සාකච්ඡාවල ප්‍රතිඵලයක් ලෙසිනි.

ඒ අනුව කොළඹ කොටුව - මාලබේ සැහැල්ලු දුම්රිය ව්‍යාපෘතිය නැවත ක්‍රියාත්මක කිරීමට රජය සූදානම් වේ.

> "මාලබේ සිට කොළඹ කොටුව දක්වා මිනිත්තු 30 කින් ගමන් කළ හැකියි"

මෙම ව්‍යාපෘතිය සඳහා විකල්ප යෝජනා ලබාගැනීම සඳහා නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා විසින් පසුගියදා කැබිනට් පත්‍රිකාවක්ද ඉදිරිපත් කර ඇත. එය රටේ අනාගතයට සුබදායකවනු ඇත. අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා පවසන්නේ රාජ්‍ය සේවකයන් දහස් ගණනක් කොළඹ - මාලබේ ඇතුළු තදාසන්න ප්‍රදේශ වල සේවය කරන බැවින් ඔවුන්ට මෙම දුම්රිය සේවයෙන් කාලයත් මුදලත් ඉතිරිකර ගත හැකි වනු ඇති බවයි.

මෙම දුම්රිය මාර්ග ව්‍යාපෘතියට මූල්‍ය හා තාක්ෂණික ආධාර සැපයීම සිදුකරන්නේ ජපානයේ ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය වන ජයිකා (**JICA**) ආයතනය විසිනි. ඒ සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 1,850 ක ණය මුදලක් ලබාදීමට ජපාන රජය එකඟතාව පළකර තිබුණි. කිලෝමීටර 16 ක දිගින් හා නැවතුම්පොළ 16 කින් සමන්විත වන සේ ඉදිකිරීමට නියමිතව තිබූ මෙම දුම්රිය සේවාව හරහා මාලබේ සිට කොළඹ කොටුව දක්වා මිනිත්තු 30 කින් ගමන් කිරීමට හැකියාව ලැබෙනු ඇත.

කාර්ය බහුල වේලාවලදී සෑම මිනිත්තු 4 කට වරක් ද, සාමාන්‍ය වේලාවලදී මිනිත්තු 10 කට වරක් ද නැවතුම්පොළකට දුම්රියක් පැමිණෙන ආකාරයට මෙම දුම්රිය සේවාව ක්‍රියාත්මක කිරීමට සැළසුම් කර තිබේ.

එසේ වුවහොත් නිකරුනේ අපතේ යන මිනිස් පැය හා අතිවිශාල ධනස්කන්ධය රටේ සංවර්ධනය වෙනුවෙන් වැයකළ හැකිවනු ඇත.

/ නාලක දහනායක




# සංවර්ධනය විධිමත් කරන්න

## ජාතික භෞතික සැලැස්මට අනුව කටයුතු කරමු



**ගාමිණී හේවගේ**
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික භෞතික
සැලසුම් දෙපාර්තමේන්තුව

රටේ නාගරීකරණය විය යුතු ප්‍රදේශ මොනවද යන්නත් එම නාගරීකරණය සඳහා ගතයුතු ක්‍රියාමාර්ග ප්‍රතිපත්ති ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් හඳුන්වාදී ඇත. මෙම සැලැස්මට අනුව රටේ සංවර්ධන සැලසුම් සිදුකරනු ලබන සියලුම රාජ්‍ය ආයතන ක්‍රියා කළයුතුවන අතර අයවැය තුළින් මුදල් වෙන් කිරීමේදී දේශපාලන අරමුණුවලින් පමණක් නොව, ජාතික භෞතික සැලැස්මේ පවතින ප්‍රතිපත්ති සැලසුම්වලට අනුවද ව්‍යාපෘති සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීම වඩාත් ඵලදායි වේ. ජනතා අවශ්‍යතාවන්ට විසඳුම් ඒ අනුව ලැබෙනු ඇත.

### ● ප්‍රවාහන අර්බුධය විසදන්නත් සැලසුම්

වර්ෂ 2007 දී ජාතික භෞතික සැලැස්ම ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් සකරනු ලැබීය. එමෙන්ම වර්ෂ 2019දී එම සැලැස්ම යාවත්කාලීන කරන ලදී. මේ වනවිට එම භෞතික සැලැස්ම 2050 වසර දක්වා යාවත්කාලීන කිරීමේ කටයුතු ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් සිදුකරමින් පවතී.

මෙරට භූමියට සාපේක්ෂව පවත්නා අදික ජන ඝනත්වය තුළින් සම්පත් බෙදී යෑමේ විෂමතාවයක් ඇති වී ඇති අතර ඒ තුළින් අවිධිමත් ජනාවාස රටාවක් සහ සංවර්ධනයක් සිදුවෙමින් පවතී. එබැවින් ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තියක් සහ සැලැස්මක් තුළින් විධිමත් සංවර්ධන ක්‍රියාවලියකට මඟ පාදාගැනීමේ හැකියාව ඇති බව ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ නිගමනයයි. ඒ අනුව මෙරට සංවර්ධනය හා නාගරීකරණය වීම නිසි පරිදි සැලසුම් සහගතව සිදුකිරීම සඳහා ජාතික භෞතික සැලැස්මෙන් මනා පිටිවහලක් ලැබේ.

### ● ජාතික භෞතික සැලැස්මට අනුව කටයුතු කිරීමෙන් ජනතා අවශ්‍යතාවයන්ට විසදුම්

අද වනවිට මෙරට ප්‍රවාහන ක්ෂේත්‍රයේ අර්බුධ ගණනාවක් හටගෙන තිබේ. මෙම ගැටළුකාරී තත්ත්වයන් මඟහරවා ගැනීමට ජාතික භෞතික සැලැස්ම මගින් ප්‍රතිපත්ති හයක් යටතේ ක්‍රියාත්මක කළ යුතු උපාය මාර්ග හඳුනාගෙන තිබේ. ඒ අනුව සැමට සමාන හා ගුණාත්මක ප්‍රවාහන සේවයක් ඇති කිරීම ( ප්‍රවාහනයේ නවීකරණය, පවතින ව්‍යුහයෙන් උපරිම ප්‍රයෝජන ගැනීම, නවීන තාක්ෂණය යෙදවීම), සක්‍රිය ප්‍රවාහන සේවයක් ඇති කිරීම, ආර්ථික කොරිඩෝ අතර ප්‍රවාහන සේවා දියුණු කිරීම, මගී ප්‍රවාහන පද්ධති දියුණු කිරීම, බස්, දුම්රිය හා ගුවන් ප්‍රවාහන සේවා සම්බන්ධීකරණය, සුහුරු ප්‍රවාහන කළමණාකරණය, පරිසර හිතකාමී ප්‍රවාහන පද්ධති ස්ථාපනය.

විශේෂයෙන්ම රටම ආවරණයවන පරිදි දුම්රිය මාර්ග සංවර්ධනය වඩාත් ලාභදායීම ප්‍රවාහන ක්‍රමය වේ. එමගින් පුද්ගල හා භාණ්ඩ ප්‍රවාහනය සිදු කිරීම මෙහි අරමුණ-වේ. ඒ යටතේ විදුලි දුම්රිය හඳුන්වාදීම (අලුත්ගම-වේයන්ගොඩ), කොළඹ-මීගමු-ව/වේයන්ගොඩ-කොළඹ-පානදුර-රාගම-කටුනායක/මීගමුව-මරදාන-හෙ-ේමාගම/හබරණ/ත්‍රිකුණාමලය), නව දුම්රිය මාර්ග ඉදිකිරීම (කුරුණෑගල/හබරණ/ෙ-බලිඅත්ත-හම්බන්තොට වැල්ලවාය හරහා පොලොන්නරුව), දැනට ඉදිකර ඇති දුම්රිය මාර්ග සංවර්ධනය,දුම්රිය ස්ථානයන්හි පහසුකම් වර්ධනය හා නවීකරණය, භාණ්ඩ ප්‍රවාහනය දිරිමත් කිරීම හා වැඩිදියුණු කිරීම, මහාමාර්ග සංවර්ධනය, අහස් මාර්ග සංවර්ධනය, ප්‍රවාහනය සඳහා ජල මාර්ග භාවිතය, පාපැදි මංතීරු සංවර්ධනය, දේශීය ගුවන්තොටුපළ සංවර්ධනය හා වැඩිදියුණු කිරීම මේ යටතේ සැලසුම් කර තිබේ.

එමෙන්ම පූජා නගර සඳහා සැලසුම් සකස් කිරීම සහ පූජා නගර සීමා ගැසට් කිරීමේ කාර්යයද ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලැබේ.

නාලක දහනායක

### රථවාහන තදබදය මට්ටු කරන්න

# කොළඹ නගරයට බහු මහල් රථගාල් 4ක්

අධික රථවාහන තදබය හේතුවෙන් දිනකට අපතේ යන මිනිස් පැය ගණන අති විශාලය. එමෙන්ම දිනකට විශාල මුදලක් ද අපට අහිමි වේ. එපමණක් නොවේ මාර්ගවල ඇතිවන රථවාහනවලින් පිටවන කාබන් ඩයොක්සයිඩ් වායුව නිසාවෙන් පරිසරයට සිදුවන හානියද අතිවිශාලය. ඒ නිසා වඩා වැදගත් වන්නේ පවතින තත්ත්වය සමනය කර ගැනීම සඳහා සුදුසු විසඳුම් සෙවීමය.

එබැවින් කොළඹ නගරයට හා තදාසන්න නගරවලට දිනපතා පැමිණෙන වාහන නිසා ඇතිවන නාගරික තදබදය අවම කිරීමේ අරමුණින් කොළඹ නගරයේ බහු මහල් රථගාල් හතරක් ඉදිකිරීමට සැලසුම් සකස්කර ඇත.

නාගරික සංවරධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතාගේ උපදෙස් පරිදි නාගරික සංවර්ධන අධිකාරිය විසින් රාජ්‍ය අංශයේ හා පෞද්ගලික අංශයේ දායකත්වය ඇතිව මෙම රථගාල් ඉදිකරනු ලැබේ.

ඒ අතරින් පෞද්ගලික අංශයේ දායකත්වය යටතේ ඉදිකළ කොළඹ 02, යූනියන් පෙදෙස පොදු රථ ගාල ජනතා අයිතියට පත් කිරීම නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතාගේ ප්‍රදානත්වයෙන් පසුගියදා සිදු කෙරුණි.

තවත් රථගාල් දෙකක් නාගරික සංවර්ධන අධිකාරිය විසින් ඉදිකරනු ලබන අතර අනෙක් රථගාල් දෙක පෞද්ගලික අශය විසින් ඉදිකෙරෙනු ඇත.

කොළඹ ටොලිකොම් ආයතනය ඉදිරිපිට, පැරණි මාළු වෙළඳ පොළ, නාරාහේන්පිට ප්‍රදේශවල මෙම රථගාල් ඉදිකිරිමට නියමිතය.

ඒ අතරින් ඇක්සස් ඉංජිනියරින් පුද්ගලික සමාගම විසින් මෙම රථගාල ඉදිකර ඇති අතර ඒ සඳහා රුපියල් මිලියන 1,400ක් වැය වී ඇත. මෙහි හිමිකාරිත්වය වසර 30න් පසුව නාගරික සංවර්ධන අධිකාරිය වෙත පැවරේ. මහල් අටකින් සමන්විත මෙම රථගාලේ වාහන 300ක් පමණ ගාල් කිරීමට හැකියාව ඇත. රථගාලේ මෙහෙයුම් කටයුතු සිදු කෙරෙන්නේ පරිගණක ඔස්සේය. නවතා තබනු ලබන සියළුම වාහනවල සම්පූර්ණ ආරක්ෂාව මේ තුළ සපයා ඇත. ඒ අනුව මාසික ආදයමෙන් ලැබෙන ආදායමෙන් 20%ක් නාගරික සංවර්ධන අධිකාරිය වෙත ලබා දීමට ගිවිසුම් ගතව ඇත.

මේ සම්බන්ධයෙන් අදහස් දැක්වූ ප්‍රසන්න රණතුංග මහතා සඳහන් කළේ කොළඹ දිස්ත්‍රික්කයේ මහජන රථගාල් නොමැති වීම නිසා ඇතිව තිබෙන ගැටළු නිරාකරණය කර ගැනීමට රාජ්‍ය හා පෞද්ගලික අංශ මැදිහත් වීමෙන් මෙවැනි නාගරික අපරව්‍යුහ ව්‍යාපෘති ඉදිරියටත් ක්‍රියාත්මක කිරීමට නාගරික සංවර්ධන අධිකාරියේ අවධානය යොමුව ඇති බවයි.

කොළඹ අවට වාහන ගාල් කිරීමේ පහසුකම් ප්‍රමාණවත් නොවීමත්, නිසි පරිදි එය ක්‍රියාත්මක නොවීමත් හේතුවෙන් නගරයේ අධික මාර්ග තදබදයක් පවතී. ඒ හේතුවෙන් ජනතාවගේ කාලය සහ මුදල් නාස්ති වීම ප්‍රධාන ගැටළුවක් බවත්, මෙවැනි නවීන තාක්ෂණයෙන් යුතු රථගාල් ආරම්භ කිරීම මගින් කොළඹ නගරයේ සංවර්ධනයට පිටිවහලක් බවත් අමාත්‍යවරයා වැඩිදුරටත් පැවසීය.



විවෘත කරන ලද රථ ගාල

ඒ අනුව ඊට අදාල සියළු කටයුතු සුදානම් කිරීමට මේ වනවිටත් පියවර ගෙන ඇති බවත් එමගින් මහජනතාව වෙත වඩාත් කාර්යක්ෂම සේවාවක් ලබා දීමට අපේක්ෂා කරන බවත් අමාත්‍යවරයා සඳහන් කළේය.

අමිල දර්ශන හේරත්

1 MAY

# பூமித் தாய்க்கு அன்பைச் சமர்ப்பித்து
# உயிரைப் பாதுகாப்பதற்கு ஒரு பிடி தண்ணீர்

கம்பஹா மாவட்டம் நாட்டிலேயே அதிக மக்கள் தொகை கொண்ட மாவட்டங்களில் ஒன்றாகும். இம்மாவட்டம் 13 பிரதேச செயலகப் பிரிவுகளைக் கொண்டுள்ளது. மொத்தத்தில் இங்குள்ள மக்கள் பல்வேறு பிரச்சினைகளை எதிர்கொள்கின்றனர். அவற்றில் குடிநீர்ப் பிரச்சினை முக்கிய இடம் வகிக்கிறது. கம்பஹா மாவட்டத்தின் அத்தனகல்ல, நிட்டம்புவ, மீரிகம, மினுவாங்கொட, தொம்பே மற்றும் அதனை சூழவுள்ள பிரதேச மக்கள் கடந்த காலங்களில் குடிநீர் பிரச்சினையால் பாதிக்கப்பட்டுள்ளனர். நாம் ஒரு நாள் உணவில்லாமல் இருக்கலாம். ஆனால் தண்ணீர் குடிக்காமல் ஒரு நிமிடம் கூட இருக்க முடியாது. தண்ணீர் மனிதனுக்கு மிகவும் இன்றியமையாதது.

- கம்பஹா மாவட்டத்தின் 440 கிராம சேவைப் பிரிவுகளில உள்ள நான்கு இலட்சம் மக்களுக்கு குடிநீர்த் திட்டம்

பஸ்னாகொட நீர்த்தேக்கத் திட்டம் கம்பஹாவின் குடிநீர் தேவைக்காக ஆரம்பிக்கப்பட்ட பெறுமதியான நீர் திட்டமாகும். இத் திட்டம் ஆரம்பிக்கப்பட்டு பல வருடங்களாகியும் பல்வேறு காரணங்களால் இதன் செயற்பாடுகள் ஆங்காங்கே நிறுத்தப்பட்டுள்ளன. கம்பஹா மாவட்ட மக்களுக்கு இந்த இழப்பு ஏற்பட்டது. எது எவ்வாறாயினும், பஸ்னாகொட நீர்த்தேக்கத் திட்டம் பற்றி அண்மையில் சில நல்ல செய்திகளைக் கேட்டோம். அதாவது பஸ்னாகொட நீர் வழங்கல் திட்டத்தின் முதற்கட்டமாக புதிய நீர் இணைப்புகளை வழங்க நடவடிக்கை எடுக்க வேண்டும்.

கம்பஹா, கரஸ்நாகல, பஸ்னாகொட நீர் வழங்கல் திட்டத்தின் முதற்கட்டமாக புதிய நீர் இணைப்புகள் வழங்கும் நடவடிக்கை அண்மையில் நகர அபிவிருத்தி மற்றும் வீடமைப்பு அமைச்சர் திரு.பிரசன்ன ரணதுங்க தலைமையில் இடம்பெற்றது. முதலில் பஸ்யால எல்லலமுல்ல, முஹந்திரம்வத்த மற்றும் கலல்பிட்டிய தாதுகந்த பிரதேசங்களில் உள்ள பயனாளி குடும்பங்களுக்கு புதிய நீர் இணைப்புகள் வழங்கப்பட்டன. நீர் வழங்கல் இராஜாங்க அமைச்சர் சனத் நிஷாந்த, கம்பஹா மாவட்ட நாடாளுமன்ற உறுப்பினர்களான சஹன் பிரதீப், கோகிலா குணவர்தன, உபுல் மகேந்திர ராஜபக்ஷ ஆகியோரும் கலந்துகொண்டனர்.

இந்த நீர் வழங்கல் திட்டத்தின் மூலம் கம்பஹா மாவட்டத்தின் 440 கிராம சேவைப் பிரிவுகளில் உள்ள சுமார் நான்கு இலட்சம் மக்களின் குடிநீர்த் தேவையை பூர்த்தி செய்ய முடியும். இந்த நீர் திட்டத்திற்காக செலவிடப்பட்ட மொத்த தொகை 33,060 மில்லியன் ரூபாவாகும். முதற்கட்டமாக அத்தனகல்ல மற்றும் பஸ்யாலையை சுற்றியுள்ள மக்களுக்கு 5,000 புதிய நீர் இணைப்புகள் வழங்கப்படவுள்ளன.

இரண்டாம் கட்டத்தின் கீழ், நிட்டம்புவ, மினுவாங்கொட மற்றும் கம்பஹாவைச் சுற்றியுள்ள பல பகுதிகள் உள்ளடக்கப்படும். இந்த குடிநீர் திட்டத்தின் இரண்டாம் கட்ட கட்டுமானப் பணிகள் வரும் ஒக்டோபர் மாதத்திற்குள் முடிக்க திட்டமிடப்பட்டுள்ளது. புதிய நீர் இணைப்புகளை வழங்குவதில் மக்களுக்கு வசதியாக 12 தவணைகளில் பணத்தைச் செலுத்தும் வகையில் வேலைத்திட்டம் ஒன்றை தயாரிக்குமாறு அமைச்சர் பிரசன்ன ரணதுங்க அதிகாரிகளுக்கு பணிப்புரை விடுத்துள்ளதாக தெரிவிக்கப்படுகின்றது.

- நீர் திட்டத்திற்காக செலவிடப்பட்ட மொத்த தொகை 33,060 மில்லியன் ரூபா

மகிந்த ராஜபக்ச ஜனாதிபதியாக இருந்த போது இந்த நீர் வழங்கல் திட்டம் ஆரம்பிக்கப்பட்டது. இதற்கு அப்போதைய பொருளாதார அபிவிருத்தி அமைச்சர் திரு.பசில் ராஜபக்ஷ மற்றும் மேல் மாகாண முதலமைச்சர் திரு.பிரசன்ன ரணதுங்க ஆகியோர் காரணமாக இருந்தனர். ஆனால் நல்லாட்சி அரசாங்கம் ஆட்சிக்கு வந்த பின்னர் அதன் செயற்பாடுகள் பாதியிலேயே நிறுத்தப்பட்டன. தற்போதைய அரசாங்கம் ஆட்சிக்கு வந்த பின்னர் 2021 இல் மீண்டும் இந்த நீர் வழங்கல் திட்டம் ஆரம்பிக்கப்பட்டது.




அத்தனகல்ல, மீரிகம, மினுவாங்கொடை, மஹர, தொம்பே உள்ளிட்ட பல பிரதேசங்களை உள்ளடக்கிய இந்த நீர் திட்டத்தின் கீழ் கம்பஹா, அத்தனகல்ல - மினுவாங்கொட கூட்டு நீர் வழங்கல் திட்டம் நடைமுறைப்படுத்தப்படவுள்ளது. நீர்ப்பாசன அமைச்சின் வழிகாட்டலின் கீழ் நீர்ப்பாசனத் திணைக்களம் மற்றும் தேசிய நீர் வழங்கல் வடிகாலமைப்புச் சபை ஆகியவற்றின் ஒத்துழைப்புடன் இத்திட்டம் நடைமுறைப்படுத்தப்படுகிறது.

ஒரு நாட்டிற்கு உண்மையில் புதிய அபிவிருத்தி திட்டங்கள் தேவை. அப்போதுதான் நாடு முன்னேறும். ஆனால் அதேபோன்று, நாட்டிலும் இதுபோன்ற திட்டங்களை செயல்படுத்துவது மிகவும் சரியானது. ஆட்சிக்கு வரும் ஒவ்வொரு அரசும் இதுபோன்ற திட்டங்களை நிறுத்தாமல் தொடர்ந்து செயல்படுத்த வேண்டும். அப்போதுதான் நாட்டு மக்கள் பயன்பெறுவார்கள்.

முனீரா அபூபக்கர்




# හිතගිය තැන Waters Edge


















ඡායා රූ - සරත් ජයතිලක

**වෝ**ටර්ස් එජ් හෝටලය, සැබෑ ශ්‍රී ලාංකේය උරුමය සහ උණුසුම් ආගන්තුක සත්කාරය අපගේ අමුත්තන් හොඳින් හඳුනන සන්ධිස්ථානයකි. ශ්‍රී ලාංකීය ඉතිහාසයෙන් බැඳුණු නගරයක් වන කෝට්ටේ ජයවර්ධනපුරය කේන්ද්‍ර කර ගනිමින් මෙම හෝටලය නිර්මාණය වී තිබේ. ජනාකීර්ණ නගරය සහ සුප්‍රසිද්ධ දියවන්නා ඔය ආශ්‍රිතව මෙය පිහිටා ඇත. එය මෙහි පැමිණෙන්නගේ සිත් ඇඳ ගැනීමට හැකි පරිසර පද්ධතියක් තුළ නිර්මාණය කර ඇත.

වෝටර්ස් එජ් යනු භෝජන සංග්‍රහ ස්ථාන, සම්මන්ත්‍රණ, සම්මන්ත්‍රණ, ප්‍රසංග, ආයතනික සිදුවීමක් හෝ පෞද්ගලික කාර්යයක් සඳහා නිර්මාණය කර ඇති නිවහනකි.

මේ වනවිට ආයතනය තුළ සේවකයෝ 450 ක් පමණ සේවය කරති. කොරෝනා වසංගතයත් සමඟ මෙරට සියළුම සංචාරක හොටෙල් සියල්ල වැසී ගියේය. නමුත් ඒ කාල සීමාවේදී වෝටර්ස් ඒජ් ආයතනය තුළ විශේෂිත වැඩසටහනක් ක්‍රියාත්මක විය. එනම් "home delivery" සංකල්පය යටතේ නිවෙස් වෙත ආහාර බෙදා හැරීමයි. එය බත්තරමුල්ල හා කොළඹ අගනගරය කේන්ද්‍ර කරගනිමින් ප්‍රථමයෙන් ආරම්භ කිරීමට වෝටර්ස් ඒජ් ආයතනයට හැකිවිය. ඒ සඳහා විශේෂ මෘදුකාංගයක් නිර්මාණය කළේය.

මෙය ආරම්භ කිරීමෙන් පසු මේ හරහා ජනතාව විශාල ප්‍රමාණයක් ආහාර ඇනවුම් කිරීම සිදු කෙරුණු නමුත් ඒ සඳහා අවශ්‍ය ප්‍රවාහන පහසුකම් නොතිබුණි. නමුත් පසුව ආයතනයේ සේවකයින් පමණක් නොව ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ද එක්ව මෙම වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක කිරීමට අපට හැකිවුණි. එය අප ලැබූ විශාල ජයග්‍රහණයකි. ආයතනයක් ලෙස පසුගිය වසර වැඩිම ආදායම සහ වැඩිම ලාබය ලැබූ වර්ෂයයි. එම ඉලක්කය කරා යෑම සඳහා ආයතනයේ සියළුම දෙනා විශාල සේවාවක් ඉටු කිරීම සම්බන්ධයෙන් ඔවුන්ට ස්තූතිවන්ත විය යුතුයි.

## ● "තුනපහ ලංකීය අවහන්හල" නමින් වෝටර්ස් ඒජ් හෝටලයට ආවේනික වූ අවහන්හලක් පවත්වා ගෙන යනු ලබයි.

මේ වනවිට මෙහි පැමිණෙන පාරිභෝගික ජනතාවට මුද්‍රිත බිල්පතක් වෙනුවට ඊ බිල්පතක් ලබා දීමේ වැඩසටනක් ආරම්භ කර තිබේ. ඒ හරහා සියළුම පාරිභෝගික ජනතාවට ඔවුන්ගේ සේවාව සම්බන්ධයෙන් ජංගම දුරකථනයට කෙටි පණිවිඩයක් ලැබෙනු ඇත.

මාස දෙකක් වැනි කෙටි කාලයක් තුළ එය ආයතනයේ සියළුම අවහන්හල් වෙලා හඳුන්වාදීමටද මේ වනවිට කටයුතු ආරම්භ කර තිබේ.

ඒ හරහා ආයතනයේ මුද්‍රණ පිරිවැය සම්පූර්ණයෙන්ම ඉතිරි කර ගැනීමට හැකි වන අතර පරිසර හිතකාමී වැඩසටහනක් ලෙස මෙය ක්‍රියාත්මක කිරීම මෙහි අරමුණයි.

මෙවර සිංහල හා දෙමළ අලුත් අවුරුද්ද වෙනුවෙන් අප ආයතනය විශේෂ වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කෙරුණි. රංවල පදනම සමඟ එක්ව අවුරුදු උළෙලක් පැවැත්විය. ඒ සඳහා සියළු මහජනතාවට සහභාගී වීමට අවස්ථාව උදා කළේය.

සිංහල සිරිත් විරිත් හා අලුත් අවුරුදු චාරිත්‍ර කොළඹ ජනතාව හා බෙදා ගැනීම මෙහි අරමුණ විය.



මලිත් පෙරේරා
සභාපති
වෝටර්ස් ඒජ් හෝටලය

ජනාකීර්ණ ජනතාවට සිංහල හා දමිළ අලුත් අවුරුද්දට තම නිවසට අවශ්‍ය කරන සියල්ල දේ එක තැනකින් ලබා ගැනීම උදෙසා මෙහි වෙනම පරිශ්‍රයක් නිර්මාණය කිරීමට අපට හැකිවිය. මෙය ආයතනය තුළ වාර්ෂිකව මෙය සංවිධානය කරනු ලබයි. එහිදී සියළුම කැවිලි වර්ග මිලදී ගැනීමටත් එම කැවිලි වර්ග පිලියෙල කරන ආකාරයත් සියැසින් දැක ගැනීමට ඔවුන්ට හැකියාවද ලැබීමද විශේෂත්වයකි.

"තුනපහ ලංකීය අවහන්හල" නමින් වෝටර්ස් ඒජ් හෝටලයට ආවේනික වූ අවහන්හලක් පවත්වා ගෙන යනු ලබයි. මෙය මෙහි විශේෂ තැනක් ගනී. එය විදේශිකයින් පවා අතරෙද ප්‍රසිද්ධියක් උසුලයි. මෙරටට පැමිණෙන සංචාරකයින්ට මෙහි පැමිණ දේශීය කෑම වර්ග පිළියෙල ආකාරය සියැසින් දැක ගැනීමින් ඒ අත්දැකීම ලබා ගැනීමටද අප කටයුතු සළසා ඇත.

මේ වනවිට කාමර 48 කින් සමන්විත නව හොටෙල් සංකීර්ණයක් ඉදිකෙරමින් පවතියි. එම නව හොටෙල් සංකීර්ණය මහල් 06කින් සමන්විතය. ලබන වසර මැද භාගය වනවිට මෙහි සියළු වැඩ අවසන් කර ජනතාවට විවෘත කිරීම අපගේ අපේක්ෂාවයි. රජයට බරක් නොවී ආයතනය මගින් ලබා ගන්නා ආදායමෙන් හා බැංකු ණය පහසුකමක් මගින් මෙය ඉදිකරනු ලබයි.

අමිල දර්ශන හේරත්




# හද ඇඳි රේඛා

## මගේ කෝළම



උණුහුම් වෙවී පීනා
කුස ගැබ සොඳුරු
හිත තුළ ඇති රූ
සෙනෙහස් ලෙයින්
පිපිලා හද විල තඹ රූ
වැඩියා සඳෙන් බැස
ආදර සුර කුමරී....
දෙසිතේ හැඟුම්
එක්වුණු තනුවකි මියුරූ
පිරිපුන් රුවක් පතමින්
බුදු ගුණ මැති රූ
හැම සෙත් බලෙන් මුව
සිනහා කිරි ඉහි රූ
දුවේ නුඹ තමයි දිවියේ
පිංකෙත මහ රූ....

- දිල් -

## ලොවේ රැජින ඇයයි



අම්මෙක්ගේ හිත
පොතක් වගේ...
දවසින් දවසට පිටුවෙන් පිටුවට
ලියවේ එහි දරුවන්ගේ අනාගතේ

පිරී තිබේ එය
දරුවන්ගේම ප්‍රශ්න වලින්
නමුදු කිසිදාක
අත්නොහැරීඅම්මා.......

ඇගේ ජීවිතයම කැප කරමින්
සෙමින් සෙමින් එකිනෙක මකා දමා
ලස්සන කරයි මුළු ජීවිතයම අම්මා
ලොවේ රැජින ද ඇයයි අම්මා.......

- ශිහාරා බංඩාර -

## ශක්තිමත් මිනිසාණනි

බලවත් මිනිසෙකි ඔබ
ගොඩනගන්න ජීවිතය ඔබේ
සිතනු එපා නැවත අතීතය ගැන

ඊයේ සිදු වූයේ මල ගෙයකි
හෙට සිදුවන්නේ මංගල්‍යයකි
ජීවිතය මෙයයි සිතට ගතයුතු
පැහැදිලි සත්‍ය ද මෙයයි

ඔබ ශක්තිමත් මිනිසෙකි
ජීවිතයේ රසය විඳින්න
සාගරයේ නිවසක් තනා
එහි ජීවත්වන්න

ශක්තිමත් මිනිසාණනි
නිසොල්මන්ව නොසිටින්න
සුළං හමන දිශාවට
සිත කැලඹී ගසා නොයන්න

- මුනීරා අබු බක්කර් -

## ආදරය...

වේලි වේලි මිනිස්සු හෙව්වේ
ආදරය
පීර පීර මිනිස්සු හෙව්වේ
ආදරය
වාර වාර ගණන් හඬ දුන්නේ
ආදරය
පාර පාර හෙව්වෙත් හමු නොවුණාත්
ආදරය

- භාග්‍යා -

## මියැදුණු හීනය



සිව්වසරක් පුරාවට
සෑම දිනකම
හමුවුනා නුඹ මාගේ දෙනෙතට,
නපුරු බැල්මක්
පැමිණ උදයක
රැගෙන ගියා නුඹ
මගෙන් සදහට,
නුඹ නොයෙන බව දැනදැනත් මා
බලන් සිටියා නුඹේ සොහොන දෙස...
සෑම මොහොතක පතන්නෙමි මා
නුඹ මගේ විතරක්ම
වනබව...

- ධනු -

## සඳානවන්ත දුවේ !



ඈත උස් ගුවන්තලේ
රිදී පහන් මිටක් වගේ
තරු බිඳක්
දිලේ... දිලේ...
අහා ඔයා කව්රුදෝ......?

- භාග්‍යා -


මේ පිටුව ඔබගේය.
ඉතිං ඔබගේ සිත් ඉපදෙන අලුත් අදහස්, කවි විතරක් නොව නිසඳැස්වලටත් මේ පිටුවේ ඉඩ ඇත.
ඔබේ නිර්මාණ අපිට එවන්න...
වට්සප් අංකය - 0773135594









# රන්මල බලකාය පුරවර වාරමේ...

**සිංහල හා හින්දු අලුත් අවුරුදු සැමරුම නිමිත්තෙන්
නාගරික සංවර්ධන අධිකාරිය
සංවිධානය කරනු ලැබූ
සංස්කෘතික උත්සවයේ ඇසගිය තැන්...**















City NEWS
MINISTRY OF URBAN DEVELOPMENT AND HOUSING
Magazine














## රූ ලොව

මෙවර City News Magazine Youtub මගින් විකාශය වන්නේ ග්‍රෑන්ඩ් ඔරියන්ටල් හෝටලය, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය හා මාලිගාවත්ත මහල් නිවාස සංකීර්ණය පිළිබඳවය.

183ක පැරණි පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුතු ග්‍රෑන්ඩ් ඔරියන්ටල් හෝටලය, කොළඹ කොටුව යෝර්ක් වීදියේ පිහිටා ඇත. ශ්‍රේෂ්ඨ රුසියානු ලේඛක ඇන්ටන් චෙකොෆ් 1890 දී ලංකාවට පැමිණි අවස්ථාවේදී නවාතැන් ගත්තේ මෙම ග්‍රෑන්ඩ් ඔරියන්ටල් හෝටලයේය. එමෙන්ම මාලිගාවත්ත මහල් නිවාස යෝජනා ක්‍රමය කොළොම්පුර පැරණිම මහල් නිවෙස්වලින් එකකි. මෙහි කලාකරුවන් ඇතුළු මෙරට සුප්‍රසිද්ධ චරිත බොහෝමයක් ජීවත්වූ නිවාස සංකීර්ණයකි. මේ සියලු කතා රසවිඳින්න ඔබත් පිවිසෙන්න City News Magazine Youtub







YouTube

